වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2021

සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන

රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය :- 406

පටුන

පිටුව

1.	**පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	
1.1.	හැඳින්වීම	**03**
1.2.	අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු	**03**
1.3.	කාර්යයන් හා කර්තව්‍යයන්	**03**
1.4.	සංවිධාන සටහන	**05**
1.5.	අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන රාජ්‍ය සංස්ථ හා ව්‍යවස්ථාපිත ආයතන	**06**
1.6.	අමාත්‍යාංශය තුළ පවතින අංශ	**06**
2.	**පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	
2.1.	ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා පුනර්ජනනීය බලශක්ති ඉලක්ක	**11**
2.2.	පුනර්ජනනීය බලශක්ති දායකත්වය ඉහළ නැංවීම	**11**
2.3.	ප්‍රධාන ජල විදුලි බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	**12**
2.4.	සුළං විදුලි බලය	**13**
2.5.	සූර්ය විදුලි බලය	**14**
2.6.	කුඩා පරිමාණ විදුලි බලාගාර	**16**
2.7.	පෙව ස්කන්ධ බලාගාර	**16**
2.8.	කසළවලින් බලශක්තිය	**16**
2.9.	ඩීසල් දහන තාප විදුලි බලාගාර ද්‍රවීකෘත ස්වාභාවික වායු (LNG) බලාගාර බවට පරිවර්තනය කිරීම	**17**
2.10.	අභියෝග	**17**
2.11.	අනාගත අරමුණු	**18**
3.	**පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	
3.1.	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	**21**
3.2.	මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය	**23**
3.3.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	**25**
4.	**පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**	
4.1.	ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	**31**
5.	**පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	
5.1.	හඳුනාගත් අදාළ තිරසර සංවර්ධන අරමුණු	**35**
5.2.	තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීම හා අභියෝග පිළිබඳ කෙටි විස්තරය	**36**
6.	**පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**	
6.1.	සේවක සංඛ්‍යා කළමනාකරණය	**41**
6.2.	මානව සම්පත් සංවර්ධනය	**41**
7.	**පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**	**45**

විගණකාධිපති වාර්තාව - ඇමුණුම

1 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් අනූන රටකි. මෙරට පුනර්ජනනීය බලශක්ති ජනනයෙහි සංවර්ධනය කර ඇති ප්‍රධාන ප්‍රභවය ජල බලය වේ. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව (Non – Conventional Renewable Energy Resources – NCRC) ලෙස සැලකෙන සුළං, සූර්ය බලය හා ජෛව ස්කන්ධ වැනි අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ද ජාතික විදුලි පද්ධතියට සම්බන්ධව ඇත.

වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "සෞභාග්‍යයේ දැක්ම" තුළ 'පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය' දැඩි ලෙස අවධාරණය කර ඇත. වර්තමාන රජය පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා ලබා දී ඇති ප්‍රමුඛත්වය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා කටයුතු කළ යුතු රාජ්‍ය අමාත්‍යාංශයක් ස්ථාපනය කිරීම මඟින් පිළිබිඹු වේ.

ඒ අනුව අංක **2187/27** දරන **2020** අගෝස්තු මස **09** දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපනය කරන ලදී.

පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය මඟින් පොසිල ඉන්ධන භාවිතය ක්‍රමක්‍රමයෙන් අඩු කරමින් බලශක්ති සුරක්ෂිතතාව අත්පත් කරගැනීමට රටට හැකිවනු ඇත. මෙමඟින් හුදෙක් පිරිසිදු පරිසරයක් නිර්මාණය වීම පමණක් නොව ඉන්ධන ආනයන පිරිවැයෙහි අඩුවීමක් සිදුවී එමඟින් අයවැය හිඟයේ අඩු වීමක් ද අපේක්ෂා කෙරේ. ඒ අනුව **2030** වර්ෂයේ විදුලිබල අවශ්‍යතාවෙන් **70%** ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මඟින් සපුරා ගැනීම ඉලක්ක කර ඇත.

1.2 අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

තිරසර ලෙස සංවර්ධිත බලශක්ති ක්ෂේත්‍රයක්

මෙහෙවර

සූර්ය බලශක්තිය, ජලය, සුළං හා ජෛව ස්කන්ධ වැනි පුනර්ජනනීය ප්‍රභව ඔස්සේ විදුලි බලය ජනනය, සාමකාමී න්‍යෂ්ටික යෙදවුම් ප්‍රවර්ධනය හා උපයෝජනය, අයනීකෘත විකිරණවලින් ජනතාව හා පරිසරය ආරක්ෂා කිරීම හා විදුලි බලය ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රයන් සඳහා නායකත්වය සැපයීම.

1.3 කාර්යයන් හා කර්තව්‍යයන්

විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත "අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

සුවිශේෂී ප්‍රමුඛතා

1. කැලණිතිස්ස බලාගාරය ස්වභාවික වායු ටර්බයින ආශ්‍රිත බලාගාරයක් බවට පත් කිරීම සහ කෙරවලපිටිය බලාගාරය පුළුල් කිරීම.
2. ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව හා උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් සංවර්ධනය කිරීම.
3. නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදම් විදුලි බලය ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති භාවිතය දිරිමත් කිරීම.
4. කොළඹ ප්‍රදේශයේ පිහිටා ඇති සියලුම ඉන්ධන බලාගාර, ස්වභාවික වායු ටර්බයින බලාගාර බවට පරිවර්තනය කිරීම.
5. ගෘහ කුටුම්භ හා කුඩා ව්‍යාපාර සඳහා අඩු වියදම් බලශක්තිය ලබාගැනීම සහතික කිරීම සඳහා වහල මත සවිකරන ලද සූර්ය කෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම.
6. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයන් දිරිමත් කිරීම.
7. 2022 වන විට බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය, 2022 වන විට උමාඔය, 2023 වන විට මොරගොල්ල හා 2024 වන විට තලපිටිගල හා සීතාවක ගඟ බලාගාර ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම.
8. 2021 වන විට මන්නාරම සුළං බලාගාරය මඟින් බලශක්තිය වාර්ෂිකව මෙගාවොට 400 ක් සහ මන්නාරම, පුනරින් හා මොණරාගල ප්‍රදේශවල සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් මෙගාවොට 800 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම

1.4 සංවිධාන ඝටනය


ලේකම්
අතිරේක ලේකම් (පාලන හා සංවර්ධන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (පාලන)
කළමනාකරණ සේවා නිලධාරී / සංවර්ධන නිලධාරී / උපාධිධාරී අභ්‍යාසලාභී
කාර්යාල සේවක/ රියදුරු
අධ්‍යක්ෂ (සංවර්ධන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
ප්‍රධාන ඉංජිනේරු
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක

1.5 අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය :
2007 අංක **35** දරන පනත මඟින් ස්ථාපනය කරන ලදී

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව :
2014 අංක **40** දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ ස්ථාපනය කරන ලදී

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය :
2014 අංක **40** දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ ස්ථාපනය කරන ලදී

1.6 අමාත්‍යාංශය තුළ පවතින අංශ

පාලන අංශය

පැවරී ඇති කාර්යයන්

- අමාත්‍යාංශයට අදාළ සියලු ම පරිපාලන කටයුතු හා යටිතල පහසුකම් සංවර්ධනය
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු නිසි පරිදි පවත්වා ගෙන යාම, නඩත්තු කිරීම සහ කාර්ය සාධනය සම්බන්ධ කටයුතු
- මානව සම්පත් සංවර්ධනයට අදාළ කටයුතු
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන සියලු ම ව්‍යවස්ථාපිත ආයතනයන්හි ආයතනික කටයුතු අධීක්ෂණය කිරීම සහ අනෙකුත් විෂයන්ට අදාළ කටයුතු
- අමාත්‍යාංශයේ සියලු ම ප්‍රවාහන සේවා හා සියලු ම නඩත්තු සේවා ඉටු කිරීම සම්බන්ධ කටයුතු

ගිණුම් අංශය

පැවරී ඇති කාර්යයන්

- මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන වලට අදාළ වියදම් ගිණුම්ගත කිරීම සම්බන්ධව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන, සංවර්ධන වැඩසටහන් යටතේ දේශීය අරමුදල් හා විදේශීය අරමුදල් උපයෝගී කරගනු ලබන ව්‍යාපෘතිවල වියදම් වාර්තා කරමින් ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි පාලනය කිරීම.

විගණන අංශය

පැවරී ඇති කාර්යයන්

- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම අනුව අවදානම් මත පදනම්ව අමාත්‍යාංශයේ වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම.
- අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් අනෙකුත් අංශ වලට මඟපෙන්වීම් ලබා දීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයන්ට අදාළව කාර්යයන් ඉටු කිරීම.
- ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ උපදෙස් මත විශේෂ විමර්ශන පැවැත්වීම.

සංවර්ධන අංශය

පැවරී ඇති කාර්යයන්

- පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම හා එම ප්‍රතිපත්ති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම
- පුනර්ජනනීය බලශක්ති ජනනයන් ජාතික පද්ධතියට එකතු කර ගැනීමේ නිර්ණය කිරීම
- ව්‍යාපෘති මූල්‍යනය සහ දායකත්ව සම්බන්ධීකරණය - බහුපාර්ශ්වීය සම්බන්ධීකරණය.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම.
- පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට අදාළ විදේශ ආයතන සමඟ සම්බන්ධීකරණය.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පැමිණෙන විදේශීය කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වීසා ලබා දීම/වීසා කාලය දීර්ඝ කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය

සැලසුම් අංශය

පැවරී ඇති කාර්යයන්

- ක්‍රියාකාරී සැලැස්ම සැකසීම
- කාර්ය සාධන වාර්තාව - රාජ්‍ය අමාත්‍යාංශය, විගණකාධිපති සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- ආයතනයන්ගේ කාර්ය සාධන වාර්තා සහ වාර්ෂික වාර්තා - කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- ගම සමඟ පිළිසඳර ප්‍රගතිය - ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යැවීම
- ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ප්‍රගතිය - අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත යැවීම
- ව්‍යාපෘති වාර්තා කැඳවීම (සියලු ම ආයතන මඟින්) සහ එම ව්‍යාපෘති වාර්තා සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- අයවැය යෝජනා ගෙන්වා ගැනීම සහ මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම
- මහා පරිමාණ ව්‍යාපෘති ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් ප්‍රගති සමාලෝචන සිදු කිරීම
- රාජ්‍ය ආයතන වෙතින් කැඳවන ප්‍රගති වාර්තා යැවීම

2 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා පුනර්ජනනීය බලශක්ති ඉලක්ක

පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්තිය හා පුනර්ජනනීය බලශක්ති ඉලක්කයන්හි මූලික අරමුණ වන්නේ, ශ්‍රී ලංකාව සාධාරණ සමාජ සංවර්ධනයකට නතු කිරීම සඳහා උපකාර කරනු පිණිස පහසු, දැරිය හැකි මිලකට බලශක්ති සේවාවන් සැපයීම සඳහා පිරිසිදු, ආරක්ෂාකාරී, තිරසර, විශ්වාසදායී හා ආර්ථික වශයෙන් ශක්‍ය බලශක්ති සැපයුමක් පවත්වා ගැනීම සහතික කිරීමයි. අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය" අනුව, 2030 වර්ෂය වන විට මෙරට විදුලිබල අවශ්‍යතාවෙන් උපරිම ප්‍රතිශතයක්, එනම් 70 % ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වලින් ලබා ගත යුතු ය. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා විදුලිබල පනතේ ප්‍රතිපාදන අනුව, ලංවිම දිගු කාලීන ජනන සැලසුම සකස් කරනු ඇත.

2.2 පුනර්ජනනීය බලශක්ති දායකත්වය ඉහල නැංවීම

ජාතික විදුලිබල පද්ධතියේ ස්ථාපිත විදුලි ජනන ධාරිතාව 2021 වර්ෂයේ දී මෙගා වොට 4,587 ක් වන අතර එහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය 57 % කි. ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ ප්‍රධාන පුනර්ජනනීය විදුලි උත්පාදන ප්‍රභවය ජල විදුලියයි. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (NCRE) ලෙස හඳුන්වන කුඩා ජල විදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ සහ ජෛව ස්කන්ධ වැනි අනෙකුත් පුනර්ජනනීය ප්‍රභවයන් ද පද්ධතියට සම්බන්ධ කරනු ලබයි. දේශීය ප්‍රභව බලශක්ති ක්ෂේත්‍රයේ කර්මාන්තයන්හි නිරත කරවීමේ හා තිරසාරත්වය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව, පහත දැක්වෙන උපාය මාර්ග අනුගමනය කිරීමෙන් පරිසර හිතකාමී බලශක්ති මූලාශ්‍ර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ පියවරක් ලෙස විදේශ විනිමය පිඩනය අඩු කිරීම සඳහා ජාතික බලශක්ති සැපයුමෙහි පුනර්ජනනීය බලශක්ති සම්පත්වල දායකත්වය ඉහල නංවා ඇත.

ප්‍රභවය		ධාරිතාව (මෙගා වොට්)	විදුලි බලාගාර සංඛ්‍යාව
ප්‍රධාන ජල විදුලිය		1,399	17
පුනර්ජනනීය බලශක්ති			
	කුඩා පරිමාණ ජල විදුලි	425	213
	සුළං	248	18
	සූර්ය	93	45
	ඩෙන්ඩ්‍රෝ හා ජෛව ස්කන්ධ	43	12
	සූර්ය පියසි	410	
එකතුව		2,618	305



2021 ජනවාරි මස සිට සැප්තැම්බර් මස මුල් භාගය දක්වා වන සමස්ත විදුලි ජනනය ගිගා වොට් පැය 11,055 කි. එයින් 41% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් ජනනය කර ඇති අතර ඒ සඳහා සමස්ත ජනනයෙන් 28% ක් ප්‍රධාන ජල විදුලි බලාගාර මඟින් ද, 13% ක් භූමිය මත ඉදි කළ සූර්ය බලාගාර, සුළං බලාගාර, ජෛව ස්කන්ධ බලාගාර හා සූර්ය පියසි මඟින් ද ජනනය කර ඇත.

2.3 ප්‍රධාන ජල විදුලි බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 31)

මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය මහනුවර දිස්ත්‍රික්කයේ උලපනේ ප්‍රදේශයේ පිහිටා ඇති අතර එය මහවැලි ගංගා ද්‍රෝණියේ ඉදි කරමින් පවතී. මෙමඟින් වාර්ෂිකව ගිගාවොට් පැය 100 ක බලශක්තියක් ජනනය කිරීමට අපේක්ෂිත ය. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) මඟින් 2017 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් මිලියන 113.86 ක ණය ප්‍රදානයක් "හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන" යටතේ ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ මූලික වැඩකටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ විය. මෙම ව්‍යාපෘතියේ වර්තමාන භෞතික ප්‍රගතිය 29% කි. රට තුළ දැනට උද්ගත වී ඇති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල පසුබෑමක් සිදු වී ඇති නමුත් 2023 නොවැම්බර් මාසය වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කර විදුලි ජනනය ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 35)

බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාර ව්‍යාපෘතියේ ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 35 ක් වනු ඇති අතර වාර්ෂිකව ගිගාවොට් පැය 126 ක විදුලි බලයක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ජල විදුලි බලාගාරය කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල ආසන්නයේ පිහිටුවා ඇත.

මෙම ව්‍යාපෘතියේ මුල් සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 82 කි. පිරිවැයෙන් 85% ක් චීනයේ කාර්මික හා වාණිජ බැංකුවෙන් (ICBC) ලබාගන්නා ණය මුදලකින් ආවරණය වන අතර ඉතිරි 15% ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුවෙන් ලබා ගන්නා ණය මුදලකින් ආවරණය කරගනු ලැබේ. එසේ වුවද, ICBC හි ණය මුදලේ වලංගුතාව 2019.12.16 වන දිනෙන් අවසන් වූ බැවින්, ලංවිම මඟින් ඉතිරි වැඩ කටයුතු නිම කිරීමට අවශ්‍ය අරමුදල් මහජන බැංකුව වෙතින් සම්පාදනය කර ගැනීම සඳහා කටයුතු කර ඇත.

මෙම ව්‍යාපෘතියේ කටයුතු වලින් 97% ක් නිම වී ඇති අතර පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීම යම් පමණකට මන්දගාමී වී ඇති නමුත් 2022 වර්ෂයේ පෙබරවාරි මස වන විට විදුලි ජනන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

උමා ඔය ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 120)

බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රදේශයේ පිහිටා ඇති උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. අපේක්ෂිත වාර්ෂික බලශක්ති නිෂ්පාදනය ගිගාවොට් පැය 290 කි. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 530 කි.
මේ වන විට ඉදි කිරීම් කටයුතුවලින් 98% ක් පමණ නිම වී ඇත. 2022 ජූනි මස වන විට මෙම ව්‍යාපෘතිය නිමකර ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත ය.

සීතාවක ගඟ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 14)

කැලණි ගඟේ අතු ගංගාවක් වන සීතාවක ගඟ ආශ්‍රිතව කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති මෙම ව්‍යාපෘතිය මෙගා වොට් 20 ක තනි ජල විදුලි බලාගාරයක් ලෙස ක්‍රියාත්මක කිරීමට මුලින් අපේක්ෂා කළ ද සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයනය අනුව ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 80 ක් වනු ඇති බවට ගණන් බලා ඇත. ඒ අනුව සිදුවන පාරිසරික බලපෑම ද සැලකිල්ලට ගනිමින් මෙම ව්‍යාපෘතිය මෙගා වොට් 7 බැගින් වන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර දෙකක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට පූර්ණ හිමිකාරිත්වය සහිත ශ්‍රී ලංකා එනර්ජීස් පුද්. සමාගම මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

තල්පිටිගල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 15)

මෙම ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරේ. චීන එක්සිම් බැංකුව සමඟ ණය ගිවිසුම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් අත්සන් කර ඇත. ව්‍යාපෘතියේ නිර්මාණ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇත. ව්‍යාපෘතිය සඳහා IEE අනුමැතිය ලබාගෙන ඇත. නැවත පදිංචි කිරීමේ ඉඩම් හඳුනාගෙන ඇත. වන්දි ගෙවීම හා ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරමින් පවතී. සමාජීය ආර්ථික අධ්‍යයනය හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය නිම කර 2024 වර්ෂයේ දී ජාතික පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත ය.

2.4 සුළං විදුලි බලය

මන්නාරම සුළං විදුලි බල උද්‍යානය (මෙගා වොට් 300)

ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ සුළං බල උද්‍යානය මන්නාරම සුළං බල උද්‍යානය වන අතර එය මන්නාරම දූපතේ දකුණු වෙරළ තීරයේ පිහිටා ඇත. පළමු පියවර ලෙස මෙගාවොට් 100 ක සුළං විදුලි බලයක් නිපදවා ඇත. මෙගාවොට් 3.45 ධාරිතාවකින් යුත් අතිනවීන සුළං ටර්බයින් 30 කින් මෙම ව්‍යාපෘතිය සමන්විත වන අතර මෙම උද්‍යානයේ සමස්ත ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 103.5 කි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අන්තර් මෝසම් සුළං පද්ධතිවල ශක්තියෙන් ප්‍රයෝජන ලබා ගැනීම සඳහා මෙය ඉදි කරන ලදී. වාර්ෂිකව ගිගාවොට් පැය 400 ක විදුලි ධාරිතාවක් ජනනය කිරීමට අපේක්ෂිත ය.

මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 200 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලද ණය මුදල මඟින් ඉදි කිරීම් සිදු කරනු ලැබේ. 2019 මාර්තු මස ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ මුල් අදියර අවසන් කර 2020 දෙසැම්බර් 08 දින සිට “තම්බපවනි” සුළං විදුලි බලාගාරය නමින් ක්‍රියාත්මක වන අතර, මේ වන විට මෙගා වොට් 30 ක ධාරිතාවක් පද්ධතියට එක් කර ඇත. බලාගාරයේ ඉතිරි මෙගා වොට් 70, 2021 වර්ෂයේ මැයි මාසයේ දී ජාතික පද්ධතියට එක් කරන ලදී.

මෙම සුළං බල උද්‍යානයේ දෙවන අදියර ලෙස, අතිරේක මෙගාවොට් 100 ක සුළං විදුලිබල ජනනයක් ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ම පුද්ගලික ආයෝජන ඔස්සේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මන්නාරම් දූපතේ හඳුනාගත් ඉඩම්වල මැනුම් කටයුතු සිදු කර ඇත. ශක්‍යතා අධ්‍යයනය, සමාජීය බලපෑම් අධ්‍යයනය හා පක්ෂි අධ්‍යයනය මේ වන විට සිදුකරමින් පවතී. ව්‍යාපෘතිය වසර 2024 දී නිම කිරීමට අපේක්ෂිත ය.

ලංකා විදුලි මණ්ඩලය මඟින් මෙගා වොට් 100 ක සුළං බලාගාරයක් මන්නාරම ප්‍රධාන භූමියේ සංවර්ධනය කිරීමට නියමිත අතර, ඒ සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත. ව්‍යාපෘතිය සඳහා පාරිසරික හා සමාජීය බලපෑම් අධ්‍යයනය සිදු කිරීමට නියමිත අතර මෙම ව්‍යාපෘතිය ද වසර 2024 දී නිම කිරීමට අපේක්ෂිත ය.

පුනරීන්ඟි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති උද්‍යානය (සුළං මඟින් - මෙගා වොට් 240 හා සූර්ය බලයෙන් - මෙගා වොට් 150)

දකුණු ආසියාවේ වැඩිම සුළං බලශක්ති විභවයක් සහිත ප්‍රදේශයක් ලෙස පුනරින් සැලකේ. පුද්ගලික ආයෝජන යටතේ මෙම උද්‍යානයේ මෙගාවොට් 240 ධාරිතාවෙන් යුත් සුළං බලාගාරයක් හා මෙගාවොට් 150 ධාරිතාවෙන් යුත් සූර්ය බලාගාරයක් ඉදි කිරීමට සැලසුම් කර ඇත.

මෙම විදුලිබල උද්‍යානය ඉදි කිරීම සඳහා අවශ්‍ය භූමිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් හඳුනා ගනු ලැබූ මැනුම් කටයුතු සිදු කර ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරමින් පවතී. පූර්ව ශක්‍යතා අධ්‍යයනය හා පක්ෂීන් හා වවුලන් සම්බන්ධයෙන් වන සමීක්ෂණය ද අවසන් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (IFC) විසින් යෝජනා කැඳවීම (REP) සඳහා අවශ්‍ය ලේඛන පිළියෙළ කිරීමේ කටයුතුවල නිරතව සිටී. පාරිසරික හා සමාජ බලපෑම් අධ්‍යයනය (ESIA) සිදු කරමින් පවතී. භූ-තාක්ෂණ සමීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත.

කුඩා පරිමාණ සුළං විදුලි බලාගාරය (මෙගාවොට් 60)

පුද්ගලික ආයෝජන උපයෝගී කරගනිමින් මන්නාරම, බෝලවත්ත, මාදම්පේ, කප්පල්තුරෙයි හා ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල මෙගාවොට් 60 ක සමස්ත ධාරිතාවක් (මෙගාවොට් 1-10 දක්වා වූ ධාරිතාවේ සුළං බලාගාර) සහිත සුළං විදුලි බලාගාර පිහිටුවීමට අපේක්ෂා කෙරේ. මන්නාරම හා ත්‍රිකුණාමලය බලාගාර ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇති අතර, මන්නාරම බලාගාරයේ මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. මාදම්පේ බලාගාරය සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමට නියමිත ය.

2.5 සූර්ය විදුලි බලය

සූර්ය බල සංග්‍රාමය - වහල මත සූර්ය පැනල සවි කිරීමේ වැඩසටහන

පියසි මත සූර්ය පැනල සවි කිරීමේ වැඩසටහන 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අතර, පුනර්ජනනීය බලශක්ති පාදක විදුලි ජනනය සඳහා සමාජයේ විවිධ ස්ථර දිරිමත් කිරීමේ අභිලාෂයෙන්, ජනනය කරන විදුලිය සඳහා ගෙවීමේ ක්‍රමවේදය 2016 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

කිලෝවොට් 50 ධාරිතාව දක්වා පියසි මත සූර්ය බල පද්ධති ස්ථාපනය කිරීම සඳහා ණය ආධාර ලබා ගැනීමට 2019 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුවේ ඇමරිකානු ඩොලර් මිලියන 50 ක මූල්‍යයන පහසුකමත් යටතේ රජය විසින් ගෘහස්ථ, කාර්මික හා වාණිජ ආයතන යන කාණ්ඩ සඳහා අඩු පොලී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. 2021 ඔක්තෝම්බර් මස වන විට දිවයින පුරා විසිරී 34,219 වූ සූර්ය පියසි පද්ධති මඟින් මෙගා වොට් 410 ක සමස්ත ධාරිතාවක් ජාතික විදුලි බල පද්ධතියට එක් වී තිබුණි.

කුඩා පරිමාණ භූමිය මත ස්ථාපිත සූර්ය විදුලි බලාගාර (මෙගාවොට් 1 X 35 සහ මෙගාවොට් 1 X 70)

මෙම ව්‍යාපෘති ද්විත්වය ඔස්සේ, ඒකක ධාරිතාව මෙගාවොට් 1 ක් වන කුඩා බලාගාර ලෙසින් භූමිය මත ස්ථාපනය කෙරෙන සූර්ය විදුලි බලාගාර පුද්ගලික ආයෝජන ඔස්සේ ස්ථාපනය කරනු ඇත. එහි සමස්ත ධාරිතාව මෙගාවොට් 105 ක් වේ. මෙයින් බලාගාර 40 ක් ස්ථාපනය කිරීමේ කටයුතු නිමකර ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. තවත් බලාගාර 14 ක ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර 2021 වර්ෂය අවසානයේ ඉදිකිරීම් නිම කරන ලදී.

මෙගාවොට 10 ධාරිතාවේ පොලොන්නරුව (කදුරුවෙල) සූර්ය බලාගාරය ක්‍රියාත්මක කරනුයේ කෝමාරිකා වගාවක් ද සමඟිනි. 2020 වර්ෂයේ දී මෙහි ටෙන්ඩරය ප්‍රදානය කරන ලද අතර මෙහෙයුම් කටයුතු 2022 වර්ෂය වන විට ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙගාවොට 01 සිට 10 දක්වා ධාරිතාවයේ සූර්ය බලාගාර (සමස්ත ධාරිතාවය මෙගා වොට 147)

සමස්ත ධාරිතාව මෙගා වොට 147 ක් වන මෙගා වොට 1 – 10 දක්වා පරාසයේ ධාරිතාවෙන් යුතු, සූර්යබල විදුලි ව්‍යාපෘති පුද්ගලික ආයෝජන යටතේ ආරම්භ කර ඇති අතර, මෙගා වොට 84 ක ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. ඉන් මෙගා වොට 54 ක ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් තාවකාලික අනුමැතිය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වසර 2022 සැප්තැම්බර් වන විට ආරම්භ කිරීමට අපේක්ෂිත ය.

මෙගාවොට 20 ධාරිතාවයේ සූර්ය බලාගාර - වාලච්චේන (මෙගා වොට 10) සහ වවුනතිවු (මෙගා වොට 10)

වාලච්චේන හා වවුනතිවු යන ප්‍රදේශවල මෙගාවොට 10 බැගින් වන සූර්ය බලාගාර දෙකක් ඉදිකිරීම සඳහා ව්‍යාපාති සංවර්ධකයින් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර ඇත. වාලච්චේන බලාගාරය සඳහා සංවර්ධනකරු විසින් නව ස්ථානයක් යෝජනා කොට ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා ගන්නා ලදී. 2022 සැප්තැම්බර් මස වන විට බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

සියඹලාණ්ඩුව සූර්යබල උද්‍යානය (මෙගා වොට 100)

මෙගාවොට 100 ක ධාරිතාවකින් යුතුව මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පිහිටුවන සූර්ය බල උද්‍යානය, ශ්‍රී ලංකාවේ පළමු මහා පරිමාණ සූර්ය බල උද්‍යානය වනු ඇත. උද්‍යානය ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540 ක භූමි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. ශක්‍යතා අධ්‍යයනය සිදු කර ඇති අතර පාරිසරික බලපෑම් අධ්‍යයනය සඳහා පාරිසරික අනුමැතිය ලැබී ඇත. මෙම ව්‍යාපෘතියේ මූල්‍ය හා තාක්ෂණික කරුණු විශ්ලේෂණය හා යෝජනා කැඳවීමේ ලේඛන සැකසීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දේ. ඒ අනුව, සම්ප්‍රේෂණ පහසුකම් ද අන්තර්ගත කරමින් ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාරික ආකෘතියක් සකසා ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් ජනනය වන විදුලිය ජාතික ජාලයට සම්බන්ධ කිරීම සඳහා යොදා ගැනෙන මැදගම - අම්පාර විදුලි සම්ප්‍රේෂණ මාර්ගයේ සංවර්ධන කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව ගිගාවොට් පැය 148 ක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉන්දීය ණය ආධාර යටතේ සූර්ය බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සූර්ය විදුලි ජනන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියානු එක්සිම් බැංකුව මඟින් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ණය ප්‍රදානයක් සිදු කිරීම සඳහා ඉන්දීය රජය එකඟ වී ඇති අතර අදාළ ණය ගිවිසුම 2021 ජුනි මස 16 වන දින අත්සන් කරන ලදී. රජයේ ගොඩනැගිලි මත සූර්ය පියසි ස්ථාපනය කිරීම (ඇ.ඩො. මිලියන 85), අඩු ආදායම්ලාභී නිවාස, ආගමික ස්ථාන හා Reverse Osmosis Plants සඳහා බලශක්ති ගබඩාකරණ පහසුකම් සහිතව සූර්ය බල කට්ටල හඳුන්වා දීම (ඇ.ඩො. මිලියන 10) සහ පාවෙන සූර්ය බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (ඇ.ඩො. මිලියන 5) මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සකස් කිරීමට අදාළ ඉන්දියානු උපදේශකවරුන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු වේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් රජයේ ගොඩනැගිලිවල ව්‍යාපෘති ස්ථාන 2,377 ක් හඳුනා ගෙන ඇති අතර ඒ හා සම්බන්ධ තාක්ෂණික අධ්‍යයනයන් සිදු කරනු

ලැබේ. ව්‍යාපෘතියේ තාක්ෂණික අධ්‍යයන කටයුතු හා අධීක්ෂණය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් 180 ක් පුහුණු කොට ඇත. මෙම වැඩසටහන යටතේ මෙගා වොට් 120 ක ධාරිතාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂිත ය.

මෙගා වොට් 150 පුනරීන් සූර්ය බල උද්‍යානය

පාරිසරික හා සමාජ බලපෑම් අධ්‍යයනය මේ වන විට සිදුවෙමින් පවතින අතර අවශ්‍ය ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ද සිදු වේ. මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

භූමිය මත ඉදිකරනු ලබන කිලෝ වොට් 100 සූර්ය බලාගාර 7,000 ක් (ගමට බලාගාරයක්)

තෝරාගත් බෙදාහැරීම් තරාපැවි හරහා ජාතික ජාලයට සම්බන්ධ වන, කිලෝ වොට් 100 බැගින් වන භූමිය මත ස්ථාපිත කුඩා පරිමාණ සූර්ය බලාගාර, දේශීය, පෞද්ගලික අංශයේ ආයෝජන මඟින් පිහිටුවීමට 2021 අයවැය යෝජනාවක් ලෙස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් 2021 – 2023 කාලසීමාව තුළ මෙගා වොට් 525 ක (AC) ධාරිතාවක් ජාතික විදුලි ජාලයට එක් කිරීම අරමුණු කර ඇත. මෙම වැඩසටහන යටතේ අවම වශයෙන් සෘජු රැකියා 10,000 ක් හා වක්‍ර රැකියා අවස්ථා 20,000 ක් පමණ ඇති කළ හැකි බව අපේක්ෂා කෙරේ. මෙම ප්‍රථම අදියර යටතේ බෙදාහැරීම් තරාපැවි 840 ක් හඳුනා ගන්නා ලද අතර, 2021 ඔක්තෝම්බර් 09 වන දින ව්‍යාපෘති 155 ක් සංවර්ධනය කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය සිදු කරන ලදී. 2022 නොවැම්බර් වන විට දෙවන අදියර ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

2.6 කුඩා පරිමාණ විදුලි බලාගාර

මෙගාවොට් 3.5 සහ 1.4 බැගින් වන ධාරිතාවක් සහිත කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 2 ක් පුද්ගලික ආයෝජන යටතේ ඉදි කෙරෙමින් පවතින අතර 2021 වර්ෂය අවසන් වීමට පෙර ජාතික විදුලි බල පද්ධතියට එක් කිරීමට අපේක්ෂිත ය. තව ද මේ වන විට ඉදිකරමින් පවතින මෙගා වොට් 13 ධාරිතාවකින් යුක්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 6 ක් 2022 වර්ෂය තුළ ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ කරනු ඇත.

2.7 පෙව ස්කන්ධ බලාගාර

වර්තමානයේ දී බලාගාර 12 ක් ඔස්සේ මෙගාවොට් 38.11 ධාරිතාවක් ජාතික විදුලි බල පද්ධතියට එක්වන අතර 2023 වන විට මෙගාවොට් 10 ක ධාරිතාවක් ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත ය.

2.8 කසළවලින් බලශක්තිය

දිවයින තුළ පිහිටි කසළවලින් විදුලිය ජනනය කිරීමේ බලාගාර දෙකක් සඳහා බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (PPA) ලංකා විදුලිබල මණ්ඩලය අත්සන් කර ඇත. මෙගා වොට් 10 ධාරිතාවකින් යුතු මුතුරාජවෙල පිහිටි කසළවලින් විදුලිය ජනනය කිරීමේ බලාගාරය 2021 පෙබරවාරි මස 18 දින බලගන්වන ලදී.

2.9 ඩීසල් දහන තාප විදුලි බලාගාර, ද්‍රවීකෘත ස්වාභාවික වායු (LNG) බලාගාර බවට පරිවර්තනය කිරීම

2024 වසරේ දී මෙරට ද්‍රවීකෘත ස්වභාවික වායු වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂිත ය. ඉන් පසුව දැනට කොළඹ ප්‍රදේශයේ ස්ථාපිත, ස්වභාවික වායු මඟින් විදුලි ජනනය කිරීම සඳහා පරිවර්තනය කළ හැකි තාප බලාගාරවල මෙහෙයුම්, ස්වභාවික වායු මඟින් සිදු කළ හැකි වනු ඇත. එලෙස පරිවර්තනය කළ හැකි බලාගාර ලෙස කෙළවරපිටිය යුගදනවි බලාගාරය (මෙගා වොට් 300), කැලණිතිස්ස සංයුක්ත චක්‍රීය බලාගාරය (මෙගා වොට් 165) හා සොජිට්ස් කැලණිතිස්ස බලාගාරය (මෙගා වොට් 172) හඳුනාගෙන ඇත.

ද්‍රවීකෘත ස්වාභාවික වායු සැපයුම යටිතල පහසුකම් සංවර්ධනය

යෝජිත විදුලි බලාගාර සඳහා ද්‍රවීකෘත ස්වාභාවික වායු සැපයීමට පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු ය.

පාවෙන ප්‍රතිවායුකරන ගබඩාකරණ ඒකකයක් හා නළ පද්ධතියක්, ඉදිකිරීම, අයිතිය හා මෙහෙයුම් (BOO) ක්‍රමවේදය යටතේ කෙළවරපිටිය ප්‍රදේශයේ ලංවිම මඟින් ස්ථාපනය කිරීම.

මේ සඳහා පුද්ගලික අංශයේ ආයෝජන සඳහා යෝජනා කැඳවීමේ ලේඛන (REP) ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින්ගේ සහය ඇතිව ලංවිම මඟින් පිළියෙළ කරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘති යෝජනා කැඳවනු ඇත.

පාවෙන ප්‍රතිවායුකරන ගබඩාකරණ ඒකකයේ සිට විදුලි බලාගාර දක්වා ද්‍රවීකෘත ස්වාභාවික වායු නල මාර්ගයක් ඉදි කිරීම.

නල මාර්ගය ඉදි කිරීම සම්බන්ධයෙන් වන වගකීම ලංකා ඛනිජතෙල් සංස්ථාව මඟින් දරනු ලබයි.

ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම

විදුලි බලාගාරවලට ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම සඳහා වර්ෂ 05කට අදාළව විශේෂ බලපත්‍රයක් බලශක්ති අමාත්‍යවරයා විසින් ලංවිම වෙත ලබා දෙනු ලබයි. මෙම ව්‍යාපෘතිවල වාණිජ මෙහෙයුම් 2024 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිත ය.

2.10 අභියෝග

- විදුලිබල ක්ෂේත්‍රයේ මූල්‍ය තත්ත්වය
- ඉදිකිරීම් සිදු කරමින් පවතින විදුලි බලාගාර නියමිත කාලයට ක්‍රියාත්මක කිරීම
- ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) සැපයුම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- ආංශික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
- පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම (සුහුරු මනු, සුහුරු ජාල සංකල්ප)
- පුනර්ජනනීය බලශක්ති සංකලනයේ දී ජාලයට ආධාර වන උපයෝගී පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා වන තාක්ෂණික අභියෝග

2.11 අනාගත අරමුණු

- **2030** වර්ෂය වන විට මෙරට විදුලිබල අවශ්‍යතාවෙන් **70%**ක්, පුනර්ජනනීය බලශක්ති ඇතුළු වඩා පරිසර හිතකාමී පිරිසිදු බලශක්ති ප්‍රභවවලින් ලබා ගැනීම
- සුහුරු ජාල සංකල්පය **(Smart Grid concept)** ක්‍රියාත්මක කිරීම
- විශේෂිත පුනර්ජනනීය බලශක්ති ජනන තාක්ෂණයන් කරා යොමු වීම
- වෙරළාසන්න මුහුදු තීරයේ සුළං බලාගාර ඉදි කිරීම
- පුනර්ජනනීය බලශක්ති ගබඩා පහසුකම් මෙරට තුළ ඇති කිරීම
- දිය මත පාවෙන සූර්ය බලාගාර ඉදි කිරීම

3 පරිච්ඡේදය

2021 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		174,899,439	8,840,000.00	ඒසිඒ-3
-	තැන්පතු		1,335,450	-	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,458,334	685,347.20	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		177,693,223	9,525,347.20	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		177,693,223	9,525,347	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		177,693,223	9,525,347	
	අඩු කළා : වියදම්			-	
-	පුනරාවර්තන වියදම්		-		

41,400,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	39,651,151	15,042,103.00	ඒසිඒ-2(ii)
82,400,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	58,143,313	8,350,045.04	
262,950,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	210,792,182	233,265,096.59	
-	පොළී ගෙවීම්	8		-	
50,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
386,800,000.00	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		308,586,645	256,657,245	
100,000.00	මූලධන වියදම් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
4,700,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	8,756,365	1,849,246.40	
340,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	209,717,200	241,110,009.00	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
100,000.00	හැකියා වර්ධනය	14	88,500	16,000.00	
-	වෙනත් මූලධන වියදම්	15	-	35,463,911.03	
344,900,000.00	මුළු මූලධන වියදම් (උ)		218,562,065	278,439,166.43	
	තැන්පතු ගෙවීම්		-	-	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,085,398	5,192,573.80	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,085,398	5,192,573.80	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		528,234,108	540,288,985	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(350,540,885)	(530,763,638)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(350,540,885)	(530,763,638)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසිඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	2020
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	-	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	4,518,702.04	4,507,226.60
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		4,518,702.04	4,507,226.60
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		3,183,252.29	4,507,226.60
දේපළ පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	1,335,449.75	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		4,518,702.04	4,507,226.60



පිටු අංක 6 සිට 117 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 113 සිට 119 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි යෙදෙන සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු හා ණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලනාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : වසන්තා පෙරේරා
තනතුර : ලේකම්
දිනය : විදුලිබල අමාත්‍යාංශය

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 28/02/2022

K.H.D.K. Samarakoon
Secretary
State Ministry of Solar, Wind and
Hydro Power Generation Project Development
No. 437, Galle Road, Colombo 03.

002

තයලනී තවමන්නන්
ප්‍රධාන ගණකාධිකාරි
සූර්යබල, සුළං හා ජල විදුලි ජනන
ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
අංක. 437, ගාල්ල පාර, කොළඹ 03.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශ

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,327,749	85,449
අග්‍රිම ලැබීම්	171,589,000	8,840,000
අත්තිකාරම් අයකර ගැනීම්	913,514	62,201
තැන්පතු ලැබීම්	1,335,450	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	175,165,713	8,987,650
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	76,944,652	7,088,426
සහනාධාර සහ මාරුකිරීම්	3,060,732	33,977
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	85,390,474	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	924,990	-
තැන්පතු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	166,320,848	7,122,403
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	8,844,865	1,865,247
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-

උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	8,844,865	1,865,246
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	8,844,865	1,865,246
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(8,844,865)	(1,865,246)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	නැත	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	386,800	389,300	308,587	79.27%
ප්‍රාග්ධන	344,900	351,900	218,562	62.1%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය		ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව		මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	නැත.					
		වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2021				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්	නැත.			
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

කරුණාකර ඇමුණුම් 1 බලන්න

4 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

1. ජාතික පද්ධතියට එකතු කළ ජල විදුලි බලය (මෙගා වොට්)
2. සූර්ය බල ශක්තිය වශයෙන් ප්‍රධාන ධාරාවට එකතු කළ විදුලිය ප්‍රමාණය (මෙගා වොට්)
3. සුළං බලයෙන් ක්‍රියාත්මක විදුලි ජනන ප්‍රමාණය මෙගා වොට් වශයෙන්
4. ජෛවස්කන්ධ (කාබනික අපද්‍රව්‍ය,ඝණ අපද්‍රව්‍ය) උපයෝජනයෙන් ජනනය කළ විදුලිය මෙගා වොට් වශයෙන්
5. ඉන්ධන හා ගල්අඟුරු භාවිත විදුලි බලාගාර ස්වාභාවික වායු (LNG) බලාගාර බවට පරිවර්තනය කර ලබා ගත් විදුලි ජනනය මෙගා වොට් ප්‍රමාණය
6. සයික්ලෝට්‍රෝන් විකිරණශීලී භාවිතයෙන් සිදු කළ නිෂ්පාදන වර්ග හා ප්‍රමාණයන්
7. පරිසරය හා මහජනතාව අයනීකරණ විකිරණ වලට නිරාවරණය වීම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
8. රටේ සංවර්ධනයට න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගැනීම සඳහා සිදු කළ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව
9. අයනීකරණ විකිරණ භාවිතා කරන්නන්ගේ බලපත්‍ර යාවත්කාලීන කළ සංඛ්‍යාව
10. ජාත්‍යන්තර වශයෙන් න්‍යෂ්ටික ක්ෂේත්‍රයට අදාළ සම්මේලන, සම්මන්ත්‍රණ, සාමාජිකත්වය ලැබීම්, බැඳීම් හා ප්‍රමිතීන් සිදු කළ සංඛ්‍යාව

5 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගත් අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණ / පරමාර්ථය	ඉලක්ක	කාර්ය සාධන දර්ශකය	ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සියලු දෙනා සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්තියක් සඳහා ප්‍රවේශය සුරක්ෂිත කිරීම.	100%ක ගෘහස්ථ විදුලියන මට්ටම සඳහා විදුලි බෙදාහැරීම් ජාලය වර්ධනය කිරීම හා ඉහල ගුණාත්මකභාවයෙන් යුත් විදුලි සැපයුම	රට තුළ විදුලියන මට්ටම			99.9%
	වර්ෂ 2030 වන විට, පුනර්ජනනීය බලශක්ති දායකත්වය, සමස්ත ජනන සංයුතියෙන් 70% ක් දක්වා ඉහල දැමීම	සමස්ත බලශක්ති සංයුතිය තුළ පුනර්ජනනීය බලශක්ති ජනනයේ දායකත්වයේ ප්‍රතිශතය		70%	
	සූර්ය පියසි සංවර්ධනය පුළුල් කිරීම මඟින්, විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම.	වසර 2020 වන විට මෙගා වොට් 200ක සූර්ය පියසි බලශක්ති ධාරිතාවක් ජාතික ජාලයට සම්බන්ධ කිරීම.			100%
	කාර්යක්ෂම උපාංග භාවිතය තුළින් බලශක්තිය ඉතිරි කර ගැනීම (ශක්ති LED පහන් වැඩසටහන)	වසර 2022 වන විට ගිගා වොට් පැය 432ක බලශක්ති ඉතිරිය	10%		
	"ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" ප්‍රකාශයට පත් කරන ලදී.	"ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" සංග්‍රහය 2019 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී.			100%
	රටෙහි විදුලි ඉල්ලුමෙන් 70%ක්, පුනර්ජනනීය බලශක්තිය ද ඇතුළු පරිසර හිතකාමී පිරිසිදු බලශක්ති ප්‍රභවයන් මඟින් සපුරා ගැනීම	සමස්ත බලශක්ති සංයුතියෙන් 20 % ක් පිරිසිදු බලශක්ති ප්‍රභවයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු භාවිතයෙන් ජනනය කිරීම	10%		

5.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සහ අභියෝග පිළිබඳ කෙටි විස්තරය

ජයග්‍රහණ

1. 2019 වර්ෂයේ දී ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රතිපත්ති සංග්‍රහය, පහත කරුණු ඉටු කර ගැනීම සඳහා දායක වනු ඇත.
   - ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන මත යැපීම ප්‍රාථමික බලශක්ති සැපයුමෙන් 50%කට අඩු මට්ටමකට පහත හෙලීම සහ සියලු පාරිභෝගිකයින් එම නිශ්චිත බලශක්තිය භාවිතා කිරීම, වසර 2015 පවතින මට්ටමට වඩා, වසර 2030 වන විට 20%කින් පහත හෙලීම.

   - පූර්ණ කාබන්හරණයට එළඹීම පිළිබඳ ශ්‍රී ලංකාවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සහ වසර 2050 වන විට සියලු බලශක්ති අගය දාමයන්වල පූර්ණ පරිවර්තනයක් සිදු කිරීම.

2. විදුලියන මට්ටම 99.9 % දක්වා වර්ධනය කිරීම.

3. විදුලිය ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ආකර්ශනීයව පවත්වා ගැනීම.

වර්ෂය	පුනර්ජනනීය බලශක්ති දායකත්වය
2019	35%
2020	54%
2021	57%



4. සූර්යබල සංග්‍රාමය වැඩසටහන දියත් කිරීම

   2021 ඔක්තෝබර් ෙ වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2021 ෘ තුළින්, මෙගා වොට් 410 ක ධාරිතාවකින් යුත් සූර්ය පියසි පද්ධති, විදුලි පාරිභෝගිකයන් 34,219 ක් විසින් ජනන පද්ධතියට එක් කර ඇත.
5. මොරගොල්ල මෙගා වොට් 31 ජල විදුලි බලාගාරය ඉදි කිරීම.

ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, 2021 වර්ෂය අවසාන වන විට 30% කට ආසන්න ප්‍රමාණයක් වැඩ නිම කර ඇත. 2023 ඔක්තෝබර් මස වන විට ජල විදුලි බලාගාරයේ විදුලි ජනනය ආරම්භ කිරීමට අපේක්ෂිත ය.

6. ධාරිතාව මෙගා වොට් 35 ක් වන ගිගා වොට් පැය 126 ක විදුලි බලයක් ජනනය කිරීමට අපේක්ෂිත බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරයෙහි නිම කිරීමේ කටයුතු අවසන් අදියරේ පසුවන අතර 97% ක ප්‍රගතියක් 2021 වර්ෂය අවසානය වන විට දක්නට ලැබේ.

7. පුනරීන්හි මෙගා වොට් 240 සුළං හා මෙගා වොට් 150 සූර්ය දෙමුහුම් බලශක්ති උද්‍යානය ව්‍යාපෘතියේ මුල් අදියර ලෙස මෙගා වොට් 50 ක සූර්ය බලධාරිතාවක් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය සැලසුම් කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීම, සමාජීය හා පාරිසරික බලපෑම් ඇගයීම සහ භූ තාක්ෂණික සමීක්ෂණය ආරම්භ කිරීමට අපේක්ෂිත ය.

8. වව්නතිව්හි මෙගා වොට් 10 බැගින් වන සූර්ය බලාගාර 02ක් හා චුන්නාකම්හි මෙගා වොට් 10 බැගින් වන සුළං බලාගාර 02ක් ඉදි කිරීම.

9. බලශක්ති කාර්යක්ෂමතා කාර්යයන් වර්ධනය කිරීම.
"ශක්ති" LED පහන් බෙදා දීමේ වැඩසටහන ආරම්භ කර ක්‍රියාත්මක කෙරෙමින් පවතී. ඒ යටතේ මේ වන විට LED පහන් 700,000කට ආසන්න ප්‍රමාණයක් විදුලි පාරිභෝගිකයින් අතර බෙදා දී ඇත.

10. වසර 2020 වන විට මෙගා වොට් 200ක සූර්ය පියසි බලශක්ති ධාරිතාවක් ජාතික ජාලයට සම්බන්ධ කිරීම.

11. අඩු ආදායම්ලාභී පවුල් 100,000 ක් සඳහා පියසි මත සවි කරන සූර්ය පැනල පද්ධති ලබා දෙමින් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා 2021 වර්ෂය අවසාන වන විට මුළු දිවයිනම ආවරණය වන පරිදි ණය ආධාර 739ක ප්‍රමාණයක් අනුමත වී ඇත.

12. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මඟින්, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) ඔස්සේ යමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට සහ දරිද්‍රතාවය අවම කිරීමට සහාය වීම අරමුණු කරගනිමින් 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වී ඇති අතර, ඇතැම් ව්‍යාපෘති දැනටමත් ආරම්භ කර ඇත.

13. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය යටතේ "ලංකා තේ" සඳහා විද්‍යාත්මක සම්භවය සත්‍යාපනය කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමට නව ව්‍යාපෘතියක් ඇරඹීම.

14. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් පරිශ්‍රය තුළ සයික්ලෝට්‍රෝන පාදක විකිරණශීලී ඖෂධ නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය යටතේ ව්‍යාපෘති ආරම්භ කිරීම.

අභියෝග

1. පුනර්ජනනීය බලශක්ති සංකලනයේ දී ජාලයට ආධාර වන සහායක පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා වන තාක්ෂණික අභියෝග .

2. පුනර්ජනනීය බලශක්තිය ඉල්ලුම මත පවතින අතර ඒ සඳහා ගබඩා පහසුකම්, පිරිවැය ඵලදායී බැටරි හා පොම්ප ජල පහසුකම් අවශ්‍ය වේ.

3. පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්හි මිල අධික වීම.

4. පුනර්ජනනීය බලශක්ති සංවර්ධන කාර්යයන් සඳහා මහා පරිමාණයේ ආයෝජනයන් අවශ්‍ය වීම.

5. දේශගුණික විපර්යාස
   - කාලගුණයෙහි අවිධිමත්භාවය, ජල විදුලි ජනනය, ජෛව ස්කන්ධ නිෂ්පාදන හා කෘෂිකාර්මික අවශේෂ මඟින් විදුලි ජනනය සඳහා තදින් බලපායි.

6. පුනර්ජනනීය බලශක්ති ජනනයේ දී ඇතිවන සමාජීය ගැටලු.
   - වන ජීවීන් හා වනාන්තර සම්බන්ධ ගැටලු
   - ගම්වාසීන් සමඟ ඇතිවන ගැටලු
   - නව ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී වෙනත් පරිසර පද්ධතිවලට ඇතිවන ගැටලු

7. කාබන්ඩයෝක්සයිඩ් (CO_2) මට්ටම අඩු කිරීම පිළිබඳව ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්ට (NDC) අදාළ ඉලක්ක, 2030 වර්ෂය වන විට සපුරා ගැනීමට කටයුතු කිරීම.
   - 4% කොන්දේසි විරහිතව පාරිසරික කාබන්ඩයෝක්සයිඩ් විමෝචන අඩු කිරීම
   - 16% අන්තර්ජාතික සහයෝගීතා තත්ත්ව යටතේ පාරිසරික කාබන්ඩයෝක්සයිඩ් විමෝචන අඩු කිරීම

8. රට තුළ දැනට උද්ගත වී ඇති කොවිඩ් - 19 වසංගත තත්ත්වය ඇතැම් ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය මන්දගාමී කිරීම.

6 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	12	07	05 * **
තෘතීයික	-	-	-
ද්විතියික	21	15	06 ***
ප්‍රාථමික	19	13	06

* අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කරනු ලබයි.

** සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් මෙම අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරෙහි රාජකාරී ආවරණය කරනු ලබයි.

*** අභ්‍යාසලාභී උපාධිධාරීහු 06 දෙනෙක් සේවය කරති.

ආයතනයේ මානව සම්පත් හිඟය කාර්ය සාධනය උදෙසා අහිතකර ලෙස බලපෑම වැළැක්වීමට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු දෙකක රාජකාරී ආවරණය කිරීමට නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇත. එසේම අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාවට අදාළව ඒ ඒ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් සිදු කර ඇත.

6.2 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදෙශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	01	2021.03.31	3,800	-	දේශීය	පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම පිළිබඳ
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	01	2021.04.22 , 23	8,500	-	දේශීය	පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම පිළිබඳ
හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණ	03	2021.11.02	15,000	-	දේශීය	රාජ්‍ය සම්පත් පිළිබඳ වගකීම් භාරය, මූලික වාර්තා සැකසීම, මු.රෙ.104 යටතේ පරීක්ෂණ කමිටු පත් කිරීම හා එම කමිටුවේ වගකීම් හා කාර්යභාරය, හානිය හා පාඩුව ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ

කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	02	2021.11.11, 12	20,000	-	දේශීය	කාර්යාල ක්‍රම හා මූලධර්ම, විධිමත් කාර්යාල ක්‍රමයක මූලික ගුණාංග, රාජ්‍ය මූල්‍ය විෂය පථය සහ නීතිමය ව්‍යුහය පිළිබඳ
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	02	2021.11.12, 19 , 26	30,000	-	දේශීය	භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය, සමීක්ෂණ පැවැත්වීමේ ක්‍රමවේදය, අපහරණ කටයුතු ක්‍රියාක්මක කරනු ලබන ක්‍රමවේදය පිළිබඳ
පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	02	2021.11.23	5,000	-	දේශීය	පෞද්ගලික ලිපි ගොනුවක් යාවත්කාලීන කිරීම, වර්යා සටහන් පත්‍ර භාවිතය පිළිබඳ

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ආයතනයේ නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමෙන් ලබා ගන්නා දැනුම කුසලතා මඟින් ආයතනයේ රාජකාරී කටයුතු වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කළ හැකි වේ.

ආයතනයේ නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන්ගේ ධනාත්මක ආකල්ප වර්ධනය වීම ද පුහුණු වැඩසටහන් තුළින් සිදු වේ.

7 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	ව්‍යාපාර හා නිෂ්පාදන කටයුතු සිදු නොවන බැවින් ගිණුම් පවත්වා ගැනීම අවශ්‍ය නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	ක්‍රියාත්මක නොවේ.		
1.6	වෙනත්	කිසිවක් නැත.		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	මෙම රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් වීම නිසා විශාල වත්කම් ප්‍රමාණයක් වෙනත් ආයතනවලින් ලැබීම හා නවක නිලධාරීන්ගේ දැනුම ප්‍රමාණවත් නොවූ නිසා වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. එමෙන්ම ස්ථාවර වත්කම් ලේඛනය භෞතිකව පවත්වාගෙන යාම අනිවාර්ය බව චක්‍රලේඛයක සඳහන් වීම නිසා සිගාස් දත්ත පද්ධතිය හරහා දෘඩ පිටපතක් පවත්වාගෙන යාම ප්‍රමාණවත් ය.	2022 වර්ෂයේ මැයි මස වන විට සියලු මිලදී ගැනීම් ඇතුළත් කර වත්කම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමත් පවරා ගත් වත්කම් ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමත් සිදු කරනු ඇත.

2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ නවක නිලධාරීන්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරියා සේවයට කැඳවීම සීමා කිරීම නිසා ඉන්වෙන්ට්‍රි ලේඛනය සකස් කිරීම ප්‍රමාද වී ඇත.	2022 මාර්තු මස වන විට ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කිරීම
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ නවක නිලධාරීන්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම නිසා තොග ලේඛනය සකස් කිරීම ප්‍රමාද වී ඇත.	2022 මාර්තු මස වන විට තොග ලේඛනය යාවත්කාලීන කිරීම
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	2021 වර්ෂය තුළ දී ස්ථාවර වත්කම් ලේඛනගත කර නොතිබීම සහ භාණ්ඩ සමීක්ෂණ සිදු නොකිරීම නිසා අපහරණ වත්කම් හඳුනාගෙන නොතිබීමෙන් හානි පාඩු ලේඛනය සකස් කිරීම ප්‍රමාද වී ඇත.	2022 වර්ෂයේ සිට හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	නවක සේවකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම හා කොවිඩ් වසංගත තත්ත්වය නිසා සේවකයින් කැඳවීම සීමා කිරීම නිසා බැරකම් ලේඛනය සකස් කිරීම ප්‍රමාද වී ඇත.	2022 වර්ෂයේ සිට බැරකම් ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම්	අනුකූල වේ		

	දෙපාර්තමේන්තමේන්තුව ට ඉදිරිපත් කිරීම			
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.	-	-
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) අනුව, ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ.	රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය දෙවන කාර්තුවේ පිහිටුවීම. රට තුළ කෙරෝනා වසංගතය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම නිසා රැස්වීම් පැවැත්වීම සීමා වීම.	2022 වර්ෂය තුළ චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන කළමනාකරණ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ.	නව රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවීම හා 2020, 2021 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබීම නිසා ඌණතාවයක් හා අතිරික්තතාවක් හඳුනාගෙන නැත.	2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර භාණ්ඩ අතිරික්තතාවය හා ඌණතාවය හඳුනාගෙන එයට අවශ්‍ය පියවර ගැනීම.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ.	භාණ්ඩ සමීක්ෂණයක් නොතිබීම නිසා ගර්හිත භාණ්ඩ හඳුනාගෙන නැත.	2022 වර්ෂයේ දී අවශ්‍ය කටයුතු සඳහා පියවර ගැනීම
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණයක් නොතිබීම නිසා ගර්හිත	2022 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණයක් සිදු

			භාණ්ඩ හදුනාගෙන නැත.	කර ගර්හිත වාහන හඳුනාගෙන ඉවත් කිරීමට පියවර ගැනීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	මෙම අමාත්‍යාංශය තුළ කල්බදු ක්‍රමයට ලබා ගත් වාහන නොමැත.		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		

11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල නොවේ.	නවක සේවකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම සහ පොත්පත් ලේඛනය නිසිපරිදි යාවත්කාලීන වී නොමැති වීම නිසා ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගොස් ඇත.	2022 වර්ෂයේ සිට ප්‍රතිපාදන සීමාවෙහි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ.		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල නොවේ.	මෙම රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් වීමත් අමාත්‍යාංශය තුළ නවක නිලධාරීන් සේවය කිරීම සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරියා සේවයට කැඳවීම අවම කිරීම නිසා අවශ්‍ය කටයුතු සිදු කිරීමට නොහැකි වීම.	2022 වර්ෂයේ සිට නිසි පරිදි කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	මෙම රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් වීමත් අමාත්‍යාංශය තුළ නවක නිලධාරීන් සේවය කිරීම සහ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරියා සේවයට කැඳවීම අවම කිරීම	2022 වර්ෂයේ සිට නිසි පරිදි කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

			නිසා අවශ්‍ය කටයුතු සිදු කිරීමට නොහැකි වීම.	
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපෙර්තමේතුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ව අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	මෙම අමාත්‍යාංශය තුළ ආදායම් ලැබීමේ මාර්ග නොමැත.		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා	අනුකූල වේ	-	-

	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක	අනුකූල වේ		

	02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් සිදු කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ.	මෙම අමාත්‍යාංශය පිහිටවනු ලැබුවේ 2020 අගෝස්තු මාසයේ දී ය. කොවිඩ් තත්ත්වය නිසා තොරතුරු ලබා ගැනීමට අසීරු වීම.	නියමිත කාල පරිච්ඡේදය තුළ අදාළ අංශවලින් තොරතුරු ලබාගෙන නිවැරදි පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.